# විශ්වවිද්‍යාල රෝහල
# ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය

# <u>පුරප්පාඩු</u>

## ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාල රෝහල වෙත සුදුසුකම්ලත් අයවලුන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ (පැයට ගෙවීමේ පදනම මත සහ තාවකාලික පදනම මත)

### 1. හෙද පාලිකා (විශේෂ ශ්‍රේණියේ හෙද නිලධාරි) - පැයට ගෙවීමේ පදනම මත

**<u>සුදුසුකම්:</u>**

I. හෙද සේවයේ විශේෂ ශ්‍රේණියේ නිලධරයෙකු වීම.

සහ

II. ජාතික හෙද / අධ්‍යාපන ආයතනය පශ්චාත් ප්‍රාථමික හෙද විදුහල විසින් පවත්වනු ලබන වාට්ටු කළමනාකරණ හා අධීක්ෂණ / ඉගැන්වීම සහ අධීක්ෂණය / මහජන සෞඛ්‍ය හෙදකම් හා විත්තඹු කර්මය / මානසික හෙදකම අඩංගු අවුරුදු 1½ ඩිප්ලෝමා පාඨමාලාව හදාරා, I වන ශ්‍රේණියේ හෙද නිලධාරි (රෝහල් සේවා, අධ්‍යාපන, මහජන සෞඛ්‍ය) තනතුරක වසර පහ (05) ක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

සහ

III. විශේෂ ශ්‍රේණියේ හෙද නිලධරයෙකු ලෙස වසර දෙක (02) කට නොඅඩු සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**<u>වැටුප:</u>**

පැයට රු. 571.00

### 2. විද්‍යුත් බත්තු රේඛන සටහන්කරු (III ශ්‍රේණිය) - පැයට ගෙවීමේ පදනම මත

**<u>සුදුසුකම්:</u>**

I. සිංහල භාෂාව / දෙමළ භාෂාව, ගණිතය, විද්‍යාව සහ තවත් එක් විෂයයකට අවම වශයෙන් සම්මාන සාමාර්ථ සහිතව දෙවරකට නොවැඩි වාර ගණනකදී ඉංග්‍රීසි භාෂාව ඇතුළුව විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත් වීම.

සහ

II. අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයෙන් ජීව විද්‍යාව විෂයට සම්මාන සාමාර්ථයක් සහිතව භෞතික විද්‍යාව, රසායන විද්‍යාව යන විෂයයන් එක්වරකදී සමත් වීම.

සහ

III. සෞඛ්‍ය අමාත්‍යාංශය මගින් මෙහෙයවනු ලබන විද්‍යුත් බන්තු රේඛණ සටහන්කරු එක් අවුරුදු (01) පූර්ණකාලීන ඩිප්ලෝමා පුහුණු පාඨමාලාව සමත්ව තිබීම.

**වැටුප:**

පැයට රු. 271.00

## 3. වෛද්‍ය රසායනාගාර තාක්ෂණවේදී (III ශ්‍රේණිය) - පැයට ගෙවීමේ පදනම මත

**සුදුසුකම්:**

I. සිංහල/දෙමළ, ගණිතය, විද්‍යාව ඇතුලු විෂයන් හතරකට සම්මාන සාමාර්ථ සහිතව එක් වරකදී විෂයයන් හයකින් අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත් වීම සහ දෙවරකට නොවැඩි වාර ගණනකදී අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් ඉංග්‍රීසි භාෂාව සමත් වීම.

සහ

II. අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයෙන් රසායන විද්‍යාව විෂයට සම්මාන සාමාර්ථයක් සහිතව සංයුක්ත ගණිතය, ජීව විද්‍යාව, භෞතික විද්‍යාව, කෘෂි විද්‍යාව යන විෂයන් අතුරින් විෂයයන් දෙකක් එකවර සමත් වීම.

සහ

III. අ. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයක් මගින් හෝ වෛද්‍ය රසායනාගාරවේදී උපාධියක් ලබා තිබීම.

හෝ

ආ. සෞඛ්‍ය අමාත්‍යාංශය මගින් මෙහෙයවනු ලබන දෑ අවුරුදු පූර්ණ කාලීන වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ ඩිප්ලෝමා පුහුණු පාඨමාලාව සමත්ව තිබීම.

සහ

IV. අ. වෛද්‍ය රසායනාගාර තාක්ෂණවේදියෙකු ලෙස ශ්‍රී ලංකාව තුළ කටයුතු කිරීමට ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචිය ලබා තිබීම.

හෝ

ආ. විදේශීය උපාධියක් ලබා ඇති අයෙක් නම් වෛද්‍ය රසායනාගාර තාක්ෂණවේදියෙකු ලෙස ශ්‍රී ලංකාව තුළ කටයුතු කිරීමට ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචිය ලබා තිබිය යුතුය.

**වැටුප:**

පැයට රු. 279.00

## 4. රෝහල් කාර්ය සහායක - තාවකාලික පදනම මත

**සුදුසුකම්:**

I. අධ්‍යාපන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් ඇතුළුව විෂයන් හයක් සමත්වී තිබීම.

**වයස් සීමාව:**

අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

**වැටුප් පරිමාණය:**

PL 1 පියවර 01 (රු.40,500.00) හි තබනු ලැබේ.

## 5. රියදුරු - තාවකාලික පදනම මත

**<u>සුදුසුකම්:</u>**

I. අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයන් හයක් සමත් වී තිබීම.

**<u>ප්‍රවීණතා :</u>**

I. මෝටර්රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කළ බර වාහන පැදවීම සඳහා වූ පැරණි රියදුරු බලපත්‍රයට අනුව මෝටර්රථ පැදවීමේ “A” ශ්‍රේණියේ රියදුරු බලපත්‍රයක් හෝ නව රියදුරු බලපත්‍රයට අනුව මෝටර්රථ පැදවීමේ “D” ශ්‍රේණියේ රියදුරු බලපත්‍රයක් ලබා තිබීම.

**<u>පළපුරුද්ද :</u>**

I. රියදුරු බලපත්‍රය ලබා ගැනීමෙන් පසු රිය පැදවීම සම්බන්ධයෙන් අවම වශයෙන් වසර තුනක (03) පළපුරුද්දක් ලබා තිබීම.

**<u>කායික සුදුසුකම් :</u>**

I. නනතුරේ රාජකාරි ඉටු කිරීමටත් දිවා රාත්‍රී කාලයේ රාජකාරි සඳහා සුදුසු තත්ත්වයක සිටිය යුතු අතර අවශ්‍යතාවය මත පැය 24 ම සේවා මුර වලට රාජකාරි සඳහා සුදුසු තත්ත්වයක සිටිය යුතු අතර ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

II. අවම උස අඩි 05 යි අඟල් 2 1/2 ක් විය යුතුය.

III. ඇස් පෙනීම සම්බන්ධයෙන් පහත සඳහන් උපමාන වල දක්වා ඇති යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

(අ). බර වාහන රියදුරන් බඳවා ගැනීමේදී ඇස් පෙනීම සම්බන්ධව ලංකා අක්ෂි වෛද්‍ය සංගමය පිළිගත් නිර්ණායක වන වම් ඇස සහ දකුණු ඇස 6/9 සීමාව තුළ පැවතිය යුතුය.

(ආ). වර්ණ අන්ධතාවය පරීක්ෂා කිරීමේදී ලංකා අක්ෂි වෛද්‍ය සංගමයේ නිර්දේශිත නිර්ණායකයන් අනුව වර්ණ අන්ධතාවය නොතිබිය යුතුය.

**<u>වයස් සීමාව:</u>**

අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

**<u>වැටුප් පරිමාණය:</u>**

PL 3 පියවර 01 (රු.43,280.00) හි තබනු ලැබේ.

## පොදු කොන්දේසි

1. මෙම පැයට ගෙවීමේ පදනම මත බඳවා ගන්නා තනතුරු සඳහා සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යාංශයේ 2025.04.28 දිනැති චක්‍රලේඛ අංක CA/SA/02/2025 අනුව ගෙවීම් සිදු කරනු ලැබේ.

2. නිසි අයුරින් සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත්‍රය සමගින් සහතික කරන ලද අධ්‍යාපන, වෘත්තීය සහ සේවා සහතික වල ඡායා පිටපත් ලියාපදිංචි තැපෑලෙන් **2025.11.04** දිනට හෝ ඊට පෙර "විධායක අධ්‍යක්ෂ, විශ්වවිද්‍යාල රෝහල, ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය, වේරහැර" යන ලිපිනයට යොමු කල යුතු අතර, ලියුම්කවරයේ ඉහළ වම් කෙළවරෙහි අයදුම් කරනු ලබන තනතුර සඳහන් කල යුතුය.

3. අයදුම්කරුවන් කෙටි ලැයිස්තු ගත කිරීමේ අයිතිය ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාල රෝහල සතුවේ. අසම්පූර්ණ, ප්‍රමාද වී යොමු කරනු ලබන සහ ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාල රෝහල් ආකෘතියට අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

4. පූර්ණකාලීනව පැයට ගෙවීමේ පදනම මත සහ තාවකාලික පදනම මත බඳවා ගනු ලබන අතර සේවය සතුටුදායක නම් වාර්ෂිකව සේවය දීර්ඝ කිරීමට කටයුතු කරනු ලැබේ.

5. අයදුම්පත්‍ර භාගත කර ගැනීමට සහ වැඩි විස්තර සඳහා ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාල වෙබ් අඩවියට පිවිසෙන්න.www.kdu.ac.lk / දුරකථන අංකය – 0112044555.

**www.kdu.ac.lk**